සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය

## බෞද්ධ ශිෂ්ටාචාරය

පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 2 ) | 02. ( 4 ) | 03. ( 5 ) | 04. ( 3 ) | 05. ( 2 ) | 06. ( 2 ) | 07. ( 3 ) | 08. ( 5 ) | 09. ( 4 ) | 10. ( 3 ) |
| 11. ( 1 ) | 12. ( 3 ) | 13. ( 4 ) | 14. ( 3 ) | 15. ( 2 ) | 16. ( 3 ) | 17. ( 4 ) | 18. ( 2 ) | 19. ( 5 ) | 20. ( 3 ) |
| 21. ( 1 ) | 22. ( 3 ) | 23. ( 2 ) | 24. ( 3 ) | 25. ( 3 ) | 26. ( 5 ) | 27. ( 2 ) | 28. ( 4 ) | 29. ( 3 ) | 30. ( 3 ) |
| 31. ( 3 ) | 32. ( 1 ) | 33. ( 4 ) | 34. ( 2 ) | 35. ( 4 ) | 36. ( 5 ) | 37. ( 4 ) | 38. ( 2 ) | 39. ( 3 ) | 40. ( 3 ) |
| 41. ( 3 ) | 42. ( 2 ) | 43. ( 1 ) | 44. ( 5 ) | 45. ( 3 ) | 46. ( 1 ) | 47. ( 2 ) | 48. ( 4 ) | 49. ( 1 ) | 50. ( 4 ) |

## II පත්‍රය

### I කොටස

(මෙහි සෑම කොටසකටම ලකුණු 4 බැගින් ලැබේ.)

(01) (1) පළමු සතිය පටිච්ච සමුප්පාදය මෙනෙහි කිරීම. දෙවියන්ගේ සැකය දුරු කිරීමට යමාමහ පෙළහර පෑම.

දෙවන සතිය කළගුණ සැළකීමේ වැදගත්කම ආදර්ශයෙන් පෙන්වා දීම. (අනිමිස ලෝචනය)

තුන්වන සතිය රුවන් සක්මනෙහි යෙදීම.

හතරවන සතිය අභිධර්මය මෙනෙහි කිරීම. සවනක් සණ බුදුරැස් විහිදීම.

පස්වන සතිය ධර්ම ගුරුතන්හි තබාගැනීම.

හයවන සතිය මුචලින්ද නාගයා වැස්සෙන් ආරක්ෂා කිරීම.

හත්වන සතිය රාජායතන කිරි පලු නුගරුක මුල පළක් බැඳ සමවත් සුවයෙන් සිටීම.

(2) ● මට්ටකුණ්ඩලීට පිහිට වීම, ● රා කල සොළසක් බීමෙන් සිහි විකල්ව බුදු රදුන් මැරීමට පැමිණි නාලාගිරි ඇත් රාජා කෙරෙහිත්, තමන්ට දාව උපන් රාහුල කුමරුටත් සමාන සෙනෙහසක් දැක්වීම, ● භාරතීය වනිතා සමාජයට උසස් නිදහසක් උරුමකර දීම, ● පූතිගත්ත තිස්ස තෙරුන්ට පිහිට වීම, ● රජ්ජුමාලාට පිහිට වීම., ● සුනීත සෝපාක දෙදෙනාට පිහිට වීම. මින් අවස්ථා දෙකක් විස්තරකර තිබීම ප්‍රමාණවත්ය.

(3) ''**සබ්බජානන සීලෝවා සබ්බං ජානාතීති සබ්බඤ්ඤු** සියල්ල දන්නා සුළු වූයේ, සියල්ල දනියි යන අර්ථයෙන් සබ්බඤ්ඤු නම් වේ. අතීත, අනාගත, වර්තමාන සියල්ල දන්නා හෙයින් බුදුරදුන් සබ්බඤ්ඤු වේ. ● පරෝපදේශ විරහිතව සියළු ආකාරයෙන් සියලු ධර්ම අවබෝධයෙහි සමර්ථ හෙයින්ද සබ්බඤ්ඤු වේ. ● සියළු සංඛත අසංඛත යම් නිරවශේෂයෙන් දන්නා බැවින් සබ්බඤ්ඤු වේ, ● ත්‍රිලක්ෂණය මැනවින් දන්නා හෙයින් සබ්බඤ්ඤු නම් වේ. ● කුසලාකුසල අව්‍යාකෘත සියල් දන්නා හෙයින් සබ්බඤ්ඤු නම් වේ.

(4) බුදුන්වහන්සේගේ දිනචරියාව, ● සිවුවනක් පිරිස ව්‍යක්ත, විනීත විශාරද බහුශ්‍රැති ධර්මධර ධර්මානු ධර්ම ප්‍රතිපන්න පිරිසක් වන තුරු තමන් වහන්සේ පිරිනිවන් නොපාන බව මාරයාට පැවසීම. ● සිවුවනක් පිරිසට අගතනතුරු ප්‍රදානය කිරීම. ● සුදුස්සාට සුදුසු තැන දෙමින් සැරියුත් මුගලන් දෙනමට අගතනතුරු ලබාදීම. ● ශ්‍රාවකයන්ගේ සුවදුක් සොයා බැලීම. ● නීති රීති මගින් අනුගාමිකයන් පීඩාවට පත්නොකිරීම. ● පිරිනිවන් මංචකයේදී පවා ''සැකයක් ඇත්නම් දැනගන්න. පසුව පසුතැවිලි නොවන්නැයි'' උපදෙස් දීම.

(5) එදිනෙදා ජීවිතයේ නෙත ගැටෙන පරිසරයෙන් උපමා ගෙනහැර දැක්වීම උදා චක්කංව ව්‍යාතෝපදං, බලිවද්දෝවජීවතී මධුවා මක්ඤතී බාලෝ, ඡායාව අනපායිනි, කුම්භූපමං කාය විමං විදිත්මා ආදී ගාථා.

● අලගද්දූපම සූත්‍රයේ පහුර උපමාව ලෙස භාවිතා කිරීම.

● සිංසපා සූත්‍රයේ දී ඇට්ටේරියා කොළ උපමාවට ගැනීම.

● කුම්බෝපම සූත්‍රයේදී ඉබ්බා උපමාකොට ගැනීම.

● ආසිවිස සූත්‍රයේදී සර්පයන් උපමාකොට ගැනීම.

● වලාහක සූත්‍රයේදී වලාකුළු උපමාකොට ගැනීම.

02. (1) ● ජටිල, ආජීවක, අචේලක, නිගන්ථ, පරිබ්‍රාජක ආදී නම් වලින් හඳුන්වන ශ්‍රමණ කණ්ඩායම් පිළිබඳ කෙටියෙන් හඳුන්වා තිබීම ප්‍රමාණවත්ය.

(2) නත්ථි දින්නං නත්ථි යිට්ඨං ............. ආදී වශයෙන් ඉදිරිපත් කොට ඇති දසවස්තුක මිත්‍යා දෘෂ්ඨිය කෙටියෙන් හඳුන්වා තිබීම ප්‍රමාණවත්ය.

(3) අජිත කේසකම්බලගේ දසවස්තුක මිත්‍යා දෘෂ්ටිය ප්‍රතික්ෂේප කරන බුදු සමය ''අත්ථි දින්නං'' ආදී වශයෙන් දසවස්තුක සම්මා දිට්ඨියක් පෙන්වා දීම. ● දසවස්තුක මිත්‍යා දෘෂ්ටියෙන් සමාජ සදාචාරය බිඳවැටෙන බව පෙන්වා දීම. (සමස්ථය සලකා ලකුණු දෙන්න)

(4) ● නිර්මාණවාදී දේව සංකල්පය බැහැර කිරීම ● ඥාණ මාර්ගය ගරුකිරීම ● නිදහස් චින්තනය ඇගයීම. ● ත්‍රිවේදය බැහැර කිරීම. ● චින්තන විප්ලවයක් ඇති කිරීම. ● යාගය ප්‍රතික්ෂේප කිරීම. ● කාන්තාවන්ට ආගමික නිදහස ලබාදීම. ● අනගාරික ජීවන ප්‍රතිපදාව.

(5) ජන්මයෙන් උරුම වූ පාරිශුද්ධිය පැවතීම. ● ආගම විෂයෙහි පාරම්පරික උරුමයක් හිමිවීම.● වේද අධ්‍යයනය අනිවාර්ය වීම. ● රජුගේ පුරෝහිත තනතුර හිමිවීම. ● ඉගැන්වීමේ තනි අයිතිය සතු වීම. ● යාගමන්ත්‍ර විශේෂඥයන් වීම ආදී කරුණුයි.

03. (1) අංග, මගධ. කාසි, කෝසල ආදී ජනපද දහසය ලියා ඇත්නම් ප්‍රමාණවත්ය. අනුපිළිවෙළ අවශ්‍ය නොවේ.

(2) මගධ, කෝසල, වත්ස, අවන්ති යන රාජාණ්ඩු සතරෙහි රජවරුන්, රාජාණ්ඩු පාලනය, රාජ්‍ය මණ්ඩල, රාජ්‍ය සීමා, අගනුවර වැනි විස්තර සපයා තිබීම ප්‍රමාණවත්ය.

(3) අග්ගඤ්ඤ සූත්‍රයට අනුව සමාජ පරිණාමයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ප්‍රභවය වූ බව. ● ආර්ථික, මනෝභාවාත්මක හා පාරිසරික සාධක රාජ්‍ය ප්‍රභවය විෂයෙහි බලපා ඇති බව. ● රාජ්‍යයේ ප්‍රභවය හේතුඵලවාදීව ඓතිහාසික පරිණාමයක් ලෙස සිදු වූ බව. අග්ගඤ්ඤ සූත්‍රයේ එන ''මහා සම්මත'' නමින් රජ කෙනෙකු බිහිවීමට පාදක වූ කතාන්දරය විස්තර විය යුතුය.

(4) ඡන්දය (කැමැත්ත), ද්වේශය (තරහ) , භය (බිය), මෝහය (මුලාව), යනුවෙන් දැක්වෙන අගතිගාමී වන කරුණු පිළිබඳව කෙටි හැඳින්වීමක් කිරීම ප්‍රමාණවත්ය.

(5) ප්‍රාණඝාතය, අදින්නාදානය, කාම මිත්‍යාචාරය, මුසාවාදා, පිසුණාවාචා, ඵරුසාවාචා, සම්ඵප්ප්‍රලාව, අපභිජ්ඣා, ව්‍යාපාද, මිච්ඡා දිට්ඨි. පිළිවෙළ අවශ්‍යයි. කරුණු 7 ක් වත් ඇත්නම් ලකුණු 01 යි. 7 ට අඩු නම් 0 යි.

04. (1) භික්ෂූන් විසින් මහජන උද්ඝෝෂණය ගැන දැක්වීමෙන් පසුව වස් විසීම අනුමත කිරීම. ● වැසි සමයේ ඇති දුෂ්කරත්වය සැලකිල්ලට ගැනීම. ● සුදුසු ස්ථාන පමණක් වස් විසීම සඳහා තෝරා ගැනීම. ● වැසි සලු අනුමත කිරීම. ● පෙර වස් හා පසු වස් සමාදානය අනුමත කිරීම. ● උපෝසතා පවාරණ විනය කර්ම අනුමත කිරීම. ● කඨින චීවරය අනුමත කිරීම.

(2) වස් ආරාධනයේ සිට (වැසි සළු පූජාවේ සිට) වස් පවාරණය දක්වා සිවු පසෙන් උපස්ථාන කිරීම. ● වස් විසූ භික්ෂූන් විසින් ගිහි ජනතාවට නිසි අනුශාසනා කිරීම. ● වස්කාලය තුළ ගිහිජනතාව විශේෂ පුණ්‍ය ක්‍රියාවල යෙදවීම. ● විහාරස්ථාන ප්‍රතිසංස්කරණය කරවීම. ● වස්කාලය තුළ උපාසක උපාසිකාවන්ද විහාරස්ථානයේ පෙහෙවස් සමාදන්ව සිටීම. (කරුණු 4 ක් වත් විස්තර විය යුතුයි.)

(3) පුද්ගලයාගේ මානසික හා මානුෂික අයිතිවාසිකම් සුරකෙන ලෙස කටයුතු කිරීම. ● උපතින් පුද්ගලයකු උස් පහත් නොවන බව පෙන්වීම. (නජච්චවාසලෝ හෝති ................ ● උපතින් රැකියා නියම කිරීම නුසුදුසු බව. ● කාන්තාවන් පහත් කොට නොසැලකීම. ● ලිංගිකත්වය මත උස් පහත් ලෙස නොසැලකීම. ● පුද්ගල සමානාත්මතාවය ගරු කිරීම. ● පූජ්‍ය උරුමය හැම දෙනාටම හිමිකර දීම.

(4) ● ප්‍රසන්න ආකල්ප ඇති වීම. ● සුභරතාව, ● අල්පේච්ඡතාව, ● සිවු පසෙහි හා දායක කුලයන්හි නොඇලීම. ● සිවුපසය ලද පමණින් තෘප්තිමත් වීම. (යථා ලාභ සන්තුට්ඨිය) ● පුද්ගල හා පාරසරික පවිත්‍රතාව ගැන සැලකිලිමත් වීම. ● ආදර්ශමත් ලෙස ඉඳුරන් සංවර කිරීම. සේඛියා වැනි විනය ශික්ෂා ගෞරවයෙන් පිළිපැදීම. ● බහු කෘත්‍ය භාවයෙන් ඈත්ව භාවනානුයෝගී වීම. ● අතීතය ගැන ශෝක නොකර, අනාගතය ගැන පාර්ථනා නෙකොට වර්තමානයේ සතුටින් ජීවත් වීම.

05. (1) ● ධම්ධර විනයධර මතවාදය. දේවදත්ත හිමියන්ගේ පංචවර ආයාචනය හා භික්ෂු නායකත්වය ඉල්ලීම. ● විනය ශික්ෂා පැනවීමේදී ඇති වූ විරෝධතා. ● දාර්ශණික මතවාද පැනනැගීම. ● උදා 1. සාති භික්ෂුවගේ සමගාමී විඤ්ඤාණ වාදය. 2. අරිට්ඨ භික්ෂුව භික්ෂූන්ට කම්සුව අනුමත කරන ලෙස ඉල්ලීම. 3. මෝඝරාජ හිමි සුන්‍යතා සංකල්පයෙන් ධර්මය දෙස බැලීමට ඉල්ලීම. 4. ඡන්න, ඡබ්බග්ගිය, උදායි වැනි භික්ෂූන්ගේ නොභික්මුණු ක්‍රියා. (පිළිතුරු සමස්ථයක් ලෙස ගෙන ලකුණු දෙන්න.)

(2) විනය ශාසනයේ ආයුෂ ලෙස පිළිගැනීම. ● ධම් විනය කොටස් කිරීම හා ආරක්ෂාව සඳහා භාණක පරම්පරා වලට පැවරීම. ● බුදුරදුන් පැනවූ ශික්ෂාපද ආරක්ෂා කිරීමටත්, නොපැනවූ ශික්ෂාපද නොපැනවීමටත් තීරණය කිරීම. ● ඡන්න හිමියන්ට බ්‍රහ්ම දණ්ඩ පැනවීමට තීරණය කිරීම. ● ආනන්ද හිමියන් පිළිබඳව මතු වූ චෝදනා සමථයට පත්කිරීම.

(3) දුසිල් මහණුන් 60,000 ක් සසුනෙන් නෙරපා හැරීම. ● නිකාය රාශියකට බෙදී සිටි භික්ෂූන් සමගි කොට විනය කම් නොකළ භික්ෂූන්ට විනය කර්ම නැවත නැවත කිරීමට නියම කිරීම. ● ධම් සංගායනාවක් පවත්වා ත්‍රිපිටකය සම්පූර්ණත්වයට පත්කිරීම. ● ධම් විනය විරෝධී මතවාද ඛණ්ඩලය කරමින් මොග්ගලී පුත්තතිස්ස හිමි ලවා කථාවත්ථුප්පකරණය සංස්කරණය කරවීම. ● 84,000 වෙහෙර විහාර කරවීම. ● ටැම්ලිපි සෙල්ලිපි මගින් අශෝක ධම් ව්‍යාප්ත කිරීම. ● ථේරවාදී බුදුදහම රටවල් 9 කට ව්‍යාප්ත කිරීම.

(4) ● බුදුරදුන් වදාල සියල්ල සුභාෂිතයයි කීම.

● අශෝක බෞද්ධයකු වී බුද්ධ චරිතයට සම්බන්ධ වැදගත් ස්ථානවලට වන්දනාවේ ගොස් ධර්ම චක්‍රය සහිත සිංහ කුළුණු පිහිටු වීම. ● තම පුතා සහ දුව පැවිදිකරවීම.

● ''බුදුන්වහන්සේ මෙහි උපන්නේය'' යි ගල් ටැඹක ලියා ලුම්බිණිය අය බද්දෙන් නිදහස් කිරීම. ● ධර්මයාත්‍රා නමින් (බෞද්ධ සිද්ධස්ථානවලට වන්දනාවේ යාම.) ● තෙවන ධර්ම සංගායනාවට අනුග්‍රහය දැක්වීම. ● සෙල්ලිපි මගින් සියරට වැසියන්ට ධර්ම කාරණා කියාදීම.

06. (1) ● පණ්ඩුකාභය රජකාලයේදී කාලවේල, චිත්තරාජ, මහේජ, ජුතින්ධර, වලවාමුඛී, පශ්චිමා රාජිණී ආදී යකුන් හා යක්ෂණියන් ඇදහීම ගැන මහවංශයේ සඳහන් වීම. ● අනුරාධපුර කැටයම් කලාවෙන් ඒ බව නිරූපනය වීම, ( වාමන රූප) ● අභයගිරියෙන් හමුවීඇති සංක පද්ම යක්ෂ රූප (බහිරව රූප) ● උන්මාද චිත්‍රා කතා පුවත.

(2) ප්‍රාග් බෞද්ධ යුගයෙහි ලංකාවේ පැවැති දේශීය හා සංක්‍රමණික ආගම්වලට සුදුසු පරිදි අනුබල දීම.

● බමුණන්ට ''සොත්ථි හාලා'' නම් ගොඩනැගිල්ල කරවීම.

● ''සිව්කා ශාලා '' සකස් කරවා ආගමික කටයුතු කිරීමට සැලැස්වීම.

● නගර නිර්මාණයේදී සියලු ආගම්වලට පූජනීය ස්ථාන ඉදිකිරීමට ඉඩම් වෙන්කර දීම.

(3) බුදුන් වහන්සේ තෙවරක් ලංකාවට වැඩම කරවීම.

● විජය රජු ලංකාවට පැමිණෙන විට පිරිත් අසා පිරිත් නූල් බැඳගෙන පැමිණීම.

● ශක්‍ය වංශික භද්දකච්චායනා කුමරිය ලක්දිවට එන විට පැවදි වෙස් ගෙන පැමිණීම. ● තපස්සු භල්ලුක වෙළඳ දෙබෑයන් කේෂධාතු රැගෙන ලක්දිවට පැමිණීම හා කේශධාතු නිදන් කොට මහියංගනයේ හා තිරියායේ චෛත්‍ය කළ බවට ජනප්‍රවාද තිබීම.

(4) ● ආරාම මූලික කරගත් ගමේ සංවර්ධනය. ● බුදු දහමට අදාළ ජන සංස්කෘතියක් බිහිවීම. ● ආගමට අනුකූල සංස්කෘතික කටයුතු වර්ධනය වීම. ● ගමයි පන්සලයි සංකල්පය මුල්කර ගත් කෘෂිකර්මයක් හා දැහැමි ආර්ථික ක්‍රියාවලියක් ඇති වීම.

07. (1) සෝණ උත්තර දෙනම විසින් බුදු දහම මුලින්ම හඳුන්වා දීම.

● ජල රකුසන් මර්දනය කොට ප්‍රාතිහාර්ය පා බුදු දහම රජ පවුලට පිළිගැන්වීම.

● ප්‍රථම නගරය තබෝන් පථොම් නගරය මුල්කර ගෙන බුදු දහම ව්‍යාප්ත වීම. ● මොන්වරුන්ගේ මැදිහත් වීමෙන් බුදුදහම ව්‍යාප්ත වීම.

(2) සියලු පිරිමින් තාවකාලිකව හෝ පැවිදි වීම. උපැවිදිවීම උත්සවාකාරයෙන් සිදු කිරීම. ● පැවිදි වීමේ සහතිකය විවාහයේදී හා රැකියා උසස් වීමේදී වැදගත් ලෙස පිළිගැනීම.

● විවාහ මංගල්‍යචාරිත්‍ර සිදුකරනු ලබන්නේ භික්ෂූන් පිරිත් දේශනාකරන විටදීය. ● ආරාමය ගමේ පූජා මධ්‍යස්ථානය හා අධ්‍යපන මධ්‍යස්ථානය වීම. ● ගිහි ජනතාව දිනපතා විහාරස්ථානයට යාම අනිවාර්යයි. ● දිනපතා උදෑසන පිණ්ඩපාතය පූජා කිරීම. ● බුද දහමේ ආරක්ෂකයා ලෙස රජතුමාට මල් පූජා කර ඉන් පසුව බුදු පිළිමයට මල් පූජා කිරීම ජන ජීවිතයේ අංගයකි. ● සියලු දෙනාම බුදු පිළිමය පළඳනාවක් ලෙස පාවිච්චි කිරීම. කරුණු 4 5 ක් ප්‍රමාණවත්ය.

(3) සංඝ සංවිධානය විහිදී ඇත්තේ පිරිමීඩයක ආකාරයෙනි.

● සංඝ සංවිධානය කොටස් 7 කි. 1. සංඝරාජයාණන් වහන්සේ. 2. උත්තරීතර සංඝ සභාව. 3. සංඝ මන්ත්‍රී මණ්ඩලය. 4. ප්‍රාදේශීය පාලන මණ්ඩලය. 5. භික්ෂු කොමසාරිස්වරු. 6. දිස්ත්‍රික් කාරක සභා. 7. ග්‍රාම සංඝකාරක සභා.

● ක්‍රියාකාරීත්වය පැවිදි කිරීම. උපසම්පදා කිරීම. විනය කර්ම කිරීම. විහාරාධිපති තනතුරුවලට පත්කිරීම. නායක තනතුරු පිරිනැමීම ආදී සියලු කටයුතු සංඝ සභාවේ අනුමැතියෙන් සිදු කිරීම.

● සංඝයා විසින් සංඝරාජ හිමි තෝරාගන්නා අතර පත්වීම දෙනු ලබන්නේ රජු විසිනි.

● සංඝාධිකරණයක් තිබීම. රටේ නීතිය අනුව කිසිම භික්ෂුවක් මහජනතාව වෙනුවෙන් ඇති උසාවි හමුවට ගෙනයා නොහැකිය.

(4) ● 13 වන මැද භාගයේ සිට දක්නට ලැබීම. රෝචරාජ රජු (රාම්බම්හෙන්) විසින් ලංකාවේ දෙවන පරාක්‍රමබාහු රජුගෙන් බුදු පිළිමයක් ලබාගැනීම. දඹදෙණි යුගයේ අද්භූත බල සහිත බුදු පිළිමයක් තායිලන්තයට වැඩමකරවීම.

● 13 වන සියවසේ උදුම්බර ගිරි මාහිමි නමක් තායිලන්ත ධර්ම ප්‍රචාරයට වැඩම වීම. 14 වන සියවසේ 2 වන භාගයේ තායිලන්ත දූත පිරිසක් ලංකාවට පැමිණ සර්වඥධාතූන් වහන්සේලා හා ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් ලබා ගැනීම. ● සිහල සංඝනිකාය පිහිටුවීම. ● 18 වන සියවසේදී කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයෙහි තායිලන්තයෙන් උපාලි මහ තෙරුන් ප්‍රමුඛ භික්ෂු පිරිසක් ලක්දිවට වැඩමකර මහනුවර මල්වතු මහාවිහාරයේදී ශ්‍යාමෝපාලි උපසම්පදාව පිහිටුවීම. ● අයෝධ්‍යා රාජ්‍යයේ දෙවන පරම රාජ රජු ලංකාරාමය ආරාමය ලාංකික භික්ෂූන්ට ඉදිකිරීම. ● ධර්මකීර්ති නම් භික්ෂුවක් ගඩලාදෙණියෙන් උපසම්පදාව ලබාගෙන තායිලන්තයට යාම. (කරුණු 4 5 ක් විස්තර වීම ප්‍රමාණවත්ය.)

08. (1) ආසනය, ත්‍රිරත්නය, ධර්මචක්‍රය, බෝධිය, සිරිපතුල, පද්මය, ඡත්‍රය වැනි සංකේතවලින් පහක් හැඳන්වීම ප්‍රමාණවත්ය.

(2) නෙළුම් මල වටකොට තීරු 4 ක් විහිදී යන සේ නිර්මාණය කර තිබීම. පළමු තීරුව ගිනිසිළු ආකාරයේ පලාපෙති. දෙවන තීරුව ඇතා, අශ්වයා, සිංහයා, ගවයා යන සත්ව පේලිය එකිනෙක පසු පස යාම. තෙවන තීරුව තන්හා ලතා හෙවත් භවලතා නම් වූ ලියවැල. සිව්වන තීරුව හංසාවලිය. අනුරාධපුර පොළොන්නරු යුගවලදී වෙනස්කම් වලට භාජනය වීම. පොළොන්නරුවේදී ගවයා ඉවත් වීම.

● අනුරාධපුර බිසෝ මාලිගය, සඳකඩ පහන හා පොළොන්නරුවේ දළදා මාලිගා භූමියේ වටදා ගෙය පිවිසුමේ ඇති සඳකඩ පහන අංග සම්පූර්ණ ඒවාය.

(3) ජනතාවට හොඳ නරක නිරූපනය කිරීමට විහාර මන්දිර වල චිත්‍ර නිර්මාණය කර තිබීම. විවිධ ජාතක කථා, බුද්ධ චරිතය, දිව්‍ය ලෝක හා අපාය වැනි සංකල්ප, වෛරය, ක්‍රෝධය වැනි දුෂ්ට සංකල්පවල භයානකකම ඉදිරිපත් කර තිබීම.

● පින් කළ අය දෙවියන් වී සැප විඳිනා ආකාරය,

● හිඳගල, ගඩලාදෙණිය, දෙගල්දෙරුව, තිවංක පිළිමගෙය, අඹුලු ලෙන් විහාරය, වැනි විහාර බිතු සිතුවම් ඇසුරු කොට ගෙන පිළිතුරු සකස්විය යුතුය.

(4) ත්‍රිපිටකය හා එහි අටුවාවලින් සිංහලයෙන් ලියවුණු සෑම ග්‍රන්ථයකටම වස්තුබීජ, තේමා, උපමාරූපක, වර්ණාක්‍රම ආදිය සපයාගෙන තිබීම.

● සිංහල හා සාහිත්‍ය සඳහා ත්‍රිපිටකයට අයත් ජාතක පාලියෙන් කතාන්දර සපයාගෙන තිබීම. උදා කව්සිළුමිණ කුසජාතකය සසදාවත සස ජාතකය මුවදෙව්දාවත මඛාදේවජාතකය උමංදාව උම්මග්ග ජාතකය සඳකිඳුරු දා කව සඳකිඳුරු ජාතකය ගුත්තිල කාව්‍ය ගුත්තිල ජාතකය කාව්‍යශේඛරය සත්තුභත්ත ජාතකය දහම් සොඬ කව දහම් සොඬ ජාතකය.

● අමාවතුර පුරිසදම්ම සාරථී ගුණය

● බුත්සරණ නව අරහාදි බුදු ගුණ

● පූජාවලිය අරහං ගුණය

● භික්ෂූන් වහන්සේලාට පැනවූ විනය නීති නැවත සිහිපත් කිරීම සඳහා සිඛ වළඳ, සිඛ වළඳ විණිස සාමණේර ප්‍රශ්නයන්ය.

● ත්‍රිවිධ චෛත්‍යයන්හි ඉතිහාසය දැක්වීමට හා ඒවා වර්නා කිරීමට

සිංහල ථූප වංශය ස්තූපය පිළිබඳ ඉතිහාසය

සිංහල බෝධිවංශය බෝධිය පිළිබඳ ඉතිහාසය

දළදා සිරිත දළදාව පිළිබඳ ඉතිහාසය

දළදා පූජාවලිය දළදාව පිළිබඳ ඉතිහාසය

● ජනතාවට ධර්මාවවාද දීමට.

ලෝවැඩ සඟරාව, සුභාෂිතය, ලෝකෝපකාරය,

● වන්දනා ගමන් වලදී ගායනා කිරීමට තුන්සරණය පොත.